**සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2018**

-----------------------------------------------------------------------------

සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල අතර 2012 ඔක්තෝබර් 30 දින එළඹි අංක. 9/574 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම, නැගෙනහිර, සබරගමුව, බස්නාහිර සහ වයඹ පළාත්වල මාර්ග කොටස් 06 ක කිලෝමීටර් 131.50 ක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 10,628 කට සමාන එ.ජ.ඩො. මිලියන 81.75 ක් වූ අතර ඉන් රු. මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො. මිලියන 60 ක් මූල්‍යායනය කිරීමට සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජූනි 03 දින ආරම්භ කර තිබුණු අතර 2020 අගෝස්තු 05 දින වන විට නිම කිරීමට නියමිතව තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා  අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ  අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| විවිධ විදේශාධාර ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 9 ක් ක්‍රියාත්මක වන අතර එම සියළු ව්‍යාපෘතිවල ව්‍යාපෘති අධීක්ෂණ පිරිවැය වූ රු.මිලියන 69.9 ක් 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එක් එක් ව්‍යාපෘති අතර වියදම් වෙන්කිරීම සඳහා ව්‍යාපෘතිය නිසි පදනමක් භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එබැවින් මෙම ව්‍යාපෘතියට අදාළ වියදම හඳුනාගත නොහැකි විය. | ව්‍යාපෘති වියදම් අධිතක්සේරු වීම. | සටහන් කරගත් අතර 2020 වර්ෂයේ සිට එක් එක් ව්‍යාපෘතිය අතර ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ වියදම් බෙදීමට පියවර ගනු ලැබේ. | ව්‍යාපෘතිය සඳහා දරන ලද තත්‍ය පිරිවැය හා ඇතිවන වගකීම් ගිණුම්ගත කිරීමේ අවශ්‍යතාවය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| මාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම. | ව්‍යාපෘතියේ මාර්ග හයම එකවර ආරම්භ නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වී තිබුණි. එබැවින්, ව්‍යාපෘති කළමනාකරණ පිරිවැය ලෙස දැරූ රු. මිලියන 70 වෙන්, පළමු කොටස අවසන් කිරීමෙන් පසු 2016 ජනවාරි සිට 2018 දක්වා කාලය සඳහා රු.මිලියන 15.5 ක් වැය කර තිබුණි. | සැලසුම් කිරීම දුර්වල වීම හේතුවෙන් ව්‍යාපෘති පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | කොන්ත්‍රාත් පැකේජ 6 ක් සම්පූර්ණ කිරීමෙන් පසු ණය ශේෂයක් පැවති අතර මුලිකව නාඋල දඹුල්ල කොටසට ඇතුළත් මහනුවර-යාපනය පාරේ කිලෝමීටර් 53+740 සිට කිලෝමීටර් 58+000 දක්වා වූ නාඋල නගර කොටස වැඩිදියුණු කිරීමට තීරණය කරන ලදී. එබැවින් සියලුම ව්‍යාපෘති එකමවිට ආරම්භ කිරීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයට නොහැකි විය. | ප්‍රමාදයකින් තොරව මාර්ගවල ඉතිරි පුනරුත්ථාපන කටයුතු වේගවත් කිරීමට පියවර ගත යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| | ------------------- | --------- | ---------------------- | -------------- |
| (අ) | මාර්ග පුනරුත්ථාපනය සඳහා නව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට පෙර ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. කෙසේ වෙතත්, 53+740 සිට 54+990 දක්වා වූ මහනුවර-යාපනය මාර්ග කොටස පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා එවැනි සැලැස්මක් සකස් කර නොතිබුණි. තවද, කොන්ත්‍රාත් කාලය 2020 අගෝස්තු 03 දිනෙන් අවසන් වන බව සඳහන් කළ නමුත් අදාළ ණය ගිවිසුම් කාලය 2020 ජනවාරි 30 දක්වා පමණක් දීර්ඝ කර තිබුණි. | ණය ගිවිසුම දීර්ඝ නොකළ හොත් මාර්ගවල සියළු පුනරුත්ථාපන කටයුතු අසම්පූර්ණ විය හැකිය. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී නාඋල - දඹුල්ල මාර්ග කොටස වැඩිදියුණු කිරීම යටතේ වූ මූලික වැඩසටහන යටතේ එම මාර්ග කොටස (නාඋල නගරය) ඇතුළත් කර තිබුණි. ණය මුදලේ වලංගු කාලය දීර්ඝ කිරීමට පියවර ගෙන ඇත. | ණය මුදලේ වලංගු කාලය දීර්ඝ කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය සඳහා ඉඩම් කැබලි 982 ක් අත්පත් කර ගැනීමට නියමිතව තිබුණද, 2018 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 53 ක වන්දි ගෙවීමෙන් ඉඩම් කැබලි 98 ක් පමණක් අත්පත් කර ගෙන තිබුණි. | වන්දි ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් වන්දි සඳහා පොලී පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | එකගවේ. | වන්දි ගෙවීමට සහ ඒ සඳහා වන අමතර වියදම් වළක්වා ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඇ) | අලවතුගොඩ සිට පලාපත්වෙල දක්වා මහනුවර-යාපනය මාර්ග කොටසේ රු. මිලියන 312.9 ක කොන්ත්‍රාත් විචලන වටිනාකම් සඳහා ගෙවීම දින 272 ක් ප්‍රමාද වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් රු. මිලියන 38.7 ක මුදලක් පොලී ලෙස ඉල්ලුම් කර තිබුණි. තවද, මහනුවර-යාපනය මාර්ගයේ අලවතුගොඩ සිට පලාපත්වෙල දක්වා කොටස සහ පලාපත්වෙල සිට නාඋල දක්වා වූ අනෙක් කොටසේ අතුරු ගෙවීම් සහතික ගෙවීම් ප්‍රමාදයන් මත පොලී වශයෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් පිළිවෙලින් රු. මිලියන 7.6 ක් සහ රු. මිලියන 8 ක් ඉල්ලුම් කර තිබුණි. | සමස්ත ව්‍යාපෘති පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි වලට අනුව, ප්‍රමාද ගෙවීම් සඳහා කොන්ත්‍රාත්කරුට හිමිකම් ඇත. ඉහළ කළමනාකරණ තීරණයක් හේතුවෙන් සහ කොන්ත්‍රාත්කරු ඒ පිළිබඳවම අරගල සිදුකළ බැවින් පොලී ගෙවීම් සිදුකර නොමැත. | අනවශ්‍ය වියදම් අවම කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 8,031 ක කොන්ත්‍රාත් පැකේජ හයක් සාදන ලදී. කෙසේ වෙතත්, ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවල සමස්ථ මිල රු.මිලියන 6,955 ක් හෙවත් ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 13 කට වඩා අඩු විය. මේ අනුව, අතාත්වික සහ අධි ඇස්තමේන්තු නිරීක්ෂණය විය. තවද, එම මාර්ගවල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ කටයුතු නිසි ලෙස සැලසුම් නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත් විචලන සහ කාලය දීර්ඝ කිරීම වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් රු. මිලියන 1,194 ක් ගෙවා තිබුණි. | අතාත්වික ඇස්තමේන්තු හේතුවෙන් අරමුදල් අනිසි ලෙස භාවිතා කිරීමේ හැකියාව. | කොන්ත්‍රාත් විචලන සහ කාලය දීර්ඝ කිරීමේ හිමිකම්වල මුළු පිරිවැය රු.මිලියන 1,194.41 ක් වන අතර එය ඇස්තමේන්තුවල ඉඩදී ඇති අවිනිශ්චිතතාවයන් ගෙන් සියයට 25 ට වඩා අඩු වේ. ඉඩම් අත්පත් කර ගැනීමේදී භූමියේ ස්වභාවය පිළිබඳ අනපේක්ෂිත තත්ත්වය සහ වෙනත් ආයතනික ප්‍රමාදයන් හේතුවෙන් ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේදී කාර්යයන්ගේ විචලනයන් වලක්වා ගත නොහැකිය . | ඉදිරියේදී යථාර්ථවාදී ඇස්තමේන්තු සකස්කරන්නේද යන්න ඇගයීමට ලක් කළ යුතුය. |